# පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ

## ආශ්‍රිත නිලධාරි සේවා ගණයේ

## සංවර්ධන නිලධාරි (මනෝ උපදේශන) තනතුර සඳහා වන බඳවාගැනීමේ පරිපාටිය

**01.** සම්බන්ධ වන ආයතන

**1.1** දෙපාර්තමේන්තුව : පරිවාස හා ළමාරක්ෂක සේවා — යොමු අංකය : PCC/01/02/20

දිනය : 2016.10.25

**1.2** අමාත්‍යාංශය : කාන්තා හා ළමා කටයුතු — යොමු අංකය : WCA/2/5/13/36/03

දිනය : 2016.11.02.

**1.3** කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම

යොමු අංකය : DMS/C/3/31/01

දිනය : 2014.12.10

**1.4** ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය : — යොමු අංකය : EST-2/REC/05/12009

දිනය : 2017.03.15

**1.5** ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය : යොමු අංකය: NSCC/4/31/1/SR-1

දිනය : 2016.11.22

**1.6** රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය : — යොමුඅංකය:PSC/EST/04-01-66/02/2015

දිනය : 2017.12.14

**02.** පත්කිරීම් බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්

**03.** සේවා ගණය පිළිබඳ විස්තර

**3.1** සේවා ගණය : ආශ්‍රිත නිලධාරී

**3.2** ශ්‍රේණි : III , II හා I

**3.3** පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය : ආයතනික අරමුණු ඉටු කිරීමේ කාර්යයන්හි දී විධායක මට්ටම්වල කාර්ය භාරයට උපස්ථම්භක වන්නා වූ, විමර්ශන, තොරතුරු හා දත්ත රැස් කිරීම/විශ්ලේෂණය/සම්පාදනය, වාර්තා සම්පාදනය, සමීක්ෂණ හා සම්බන්ධීකරණය වැනි කාර්යයන් අතුරින් නිශ්චිත කාර්ය භාරයන් පැවරෙන්නා වූ ද, බඳවා ගැනීමේ මූලික සුදුසුකම් වශයෙන් පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් අවශ්‍ය වන්නා වූ ද කාර්ය භාරයක් පැවරෙන සේවා ගණයකි.

(125)

3.4 කාර්යයන් පැවරීම : ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර, මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාව මත ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාව පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයෙකුට දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලැබිය හැක.

**04** තනතුරෙහි/තනතුරුවල ස්වභාවය : ස්ථිර , විශ්‍රාම වැටුප් සහිත

(විශ්‍රාම වැටුප් ක්‍රමය රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට යටත් විය යුතුය.)

**05.** වැටුප්

**5.1** වැටුප් කේත අංකය : MN- 4 – 2016

**5.2** වැටුප් පරිමාණය (මාසික) :

රු.31,490-10x445-11x660-10x730-5x750-54250/-

**5.3** ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර:

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | වැටුප් තලය (රු.) |
|---|---|---|
| III | පියවර 01 | 31,490/- |
| II | පියවර 12 | 36,600/- |
| I | පියවර 23 | 43,930/- |

වර්ෂ 2016දින සිට 2020 දින දක්වා වැටුප් ගෙවීම හා සෙසු කරුණු රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි විධිවිධාන වලට අනුකූලව විය යුතුය.

**06.** සේවා ගණයට අයත් තනතුර / තනතුරු

**6.1** අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන්

| අනුමත තනතුරු නාම | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| සංවර්ධන නිලධාරි (මනෝ උපදේශන) | III , II , I | 02 | I. ජාතික ළමා පුහුණු හා උපදේශන සේවා මධ්‍යස්ථානයේ නේවාසික දරුවන්ගේ මනෝ උපදේශන කටයුතු<br><br>II. දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පවරනු ලබන අනෙකුත් කාර්යයන් |

(124)

**6.2** ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව : **02**

ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්යය සඳහා III , II හා I ශ්‍රේණින් සියල්ල ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් සේ සැලකේ.

**07.** බඳවා ගැනීමේ ක්‍රමය

**7.1** බඳවාගන්නා ප්‍රතිශතයන්

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | 100% |
| සීමිත | අදාල නොවේ |
| කුසලතා | අදාල නොවේ |

**7.2** විවෘත බඳවා ගැනීම

**7.2.1** බඳවාගන්නා ශ්‍රේණිය : III ශ්‍රේණිය

**7.2.2** සුදුසුකම් :

**7.2.2.1** අධ්‍යාපන සුදුසුකම් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් සමාජ විද්‍යාව /මනෝ විද්‍යාව පිළිබඳ උපාධියක් ලබා තිබීම.

**7.2.2.2.** **වෘත්තීය සුදුසුකම් :** විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ ශ්‍රී ලංකා සමාජ සංවර්ධන ආයතනයේ උපදේශනය පිළිබඳ මාස 06 කට නොඅඩු ඩිප්ලෝමාවක් හදාරා තිබීම

**7.2.2.3** **පළපුරුද්ද :** අදාල නොවේ.

**7.2.2.4** **කායික සුදුසුකම් :** සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

**7.2.2.5** වෙනත් :

i. ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.

ii. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

iii. තනතුරට බඳවාගැනීම සඳහා 7.2.2. සිට 7.2.3 දක්වා සුදුසුකම් සියල්ල සම්පූර්ණ කළ යුතු බවට අයදුම් පත් කැඳවීමේ නිවේදනයේ/ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය

**7.2.3** වයස:

**7.2.3.1** අවම සීමාව : අවුරුදු 21 ට නොඅඩු

**7.2.3.2** උපරිම සීමාව: අවුරුදු 35 ට නොවැඩි

**7.2.4** බඳවා ගැනීමේ ක්‍රමය :

**7.2.4.1** ලිඛිත විභාගය : අදාළ නොවේ.

**7.2.4.2** වෘත්තීය පරීක්ෂණය : අදාළ නොවේ.

**7.2.4.3** සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : අදාළ නොවේ.

**7.2.4.4** යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය :

| ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සළකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 01. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 25 | අදාල නොවේ |
| 02. තනතුරට අදාළව ලබා ඇති අතිරේක වෘත්තීය සුදුසුකම් | 15 | |
| 03. පළපුරුද්ද | 25 | |
| 04. පරිගණක හැකියාව | 15 | |
| 05. ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය | 15 | |
| 06. සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතා | 05 | |
| එකතුව | 100 | |

(122)

සටහන:

1. සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් අතුරින් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසල

   තා අනුපිළිවෙල අනුව හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරට බඳවා ගනු ලැබේ.
2. බඳවා ගැනීම සිදු කරන අවස්ථාවේ දී ඉහත වගුවෙහි දැක්වෙන ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු ප්‍රමාණයන් ඇතුළත, යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා විස්තරාත්මක ලකුණු පරිපාටිය අනුමත කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.
3. විස්තරාත්මක ලකුණු පරිපාටිය අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ ප්‍රසිද්ධ කළයුතුවේ.

**7.2.4.4.1 යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරනු ලබන**

**බලධරයා :** රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ කොමසාරිස්

**7.2.5** **අයදුම්පත් කැඳවීමේ ක්‍රමය :** රජයේ ගැසට් පත්‍රයේ පලකිරිම හෝ ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම් පළ කිරීම සහ වෙබ් අඩවියේ පළ කිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**7.3** **සීමිත බඳවා ගැනීම :** අදාළ නොවේ.

## 08. කාර්යක්ෂමතා කඩඉම

**8.1**

| කුමන කාර්යක්ෂමතා කඩඉමද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙර ද | ලිඛිත පරීක්ෂණය/ වෘත්තීයපරීක්ෂණය/ සහතිකපාඨමාලාව/ වෙනත් |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම | III වන ශ්‍රේණියට බඳවාගෙන වසර 03 ක් ගත වීමට පෙර | ලිඛිත පරීක්ෂණයකි |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම | II ශ්‍රේණියට උසස් වී වසර 03 ක් ගත වීමට පෙර | ලිඛිත පරීක්ෂණයකි |
| 3 වන කාර්යක්ෂමතා කඩඉම | I ශ්‍රේණියට උසස් වී වසර 05 ක් ගත වීමට පෙර | ලිඛිත පරීක්ෂණයකි |